**වේලනෙයි ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 29 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 30 දිනයේත් සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, වේලනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වික්‍රමනායක ගිණුම්කරණ ප්‍රතිපත්තිය, හිඟ උපචිත, පළාත් පාලන ආයතනවල ගිණුම්කරණ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදිය පදනම් කරමින් පිළියෙල කර ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

#### (ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.885,000 ක් වූ සතිපොළ ගොඩනැගිල්ලෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සුසාන භූමි 15 ක වටිනාකම වර්ෂ 1 ක සිට වර්ෂ 6 දක්වා කාලයේදී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | අයිතිය පවරා ගැනීමෙන් පසුව වත්කම්වලට එකතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 440,478 ක් වූ ස්ථාවර තැන්පතුවක සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | දිසාපතිවරයා විසින් සනාථ කිරීමේ සාක්ෂි තමන් සතුව නොමැති බව සඳහන් කර ඇත. | සනාථ කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුමට අමුණනු ලැබේ. | අදාළ පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| III පරිච්ඡේදයේ 32 වගන්තිය | වරිපනම් හා බදු තක්සේරු ලේඛනය නඩත්තු කර නොතිබූ අතර, වරිපනම් හා බදු අයකිරීම්ද සිදුකර නොතිබුණි. | ගැසට් පත්‍රයේ පලකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාළ රීතින්හි උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහන 10 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | කඩිනමින් පරීක්ෂාව සිදුකරනු ලැබේ. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | | | |
| | 2018.01.24 දිනැති අංක 05/2018(1)(අ) දරන චක්‍රලේඛය | මහජන සේවා ලැයිස්තුව සකස් කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | වෙනස්කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| | 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | හැකියා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් මානව සම්පත් සැලැසුම් සකස් කර නොතිබූ අතර සේවකයින්ට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | කාර්ය මණ්ඩල හිඟය නිසා හැකියා වර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරී පත්කළ නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඉ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දි නොතිබුණි. | අන්තර්ජාල පහසුකම් සලසා දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව අදාල ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දේපළ බදු සම්බන්ධිත ක්‍රියාමාර්ගයන් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉඩම්වලින් විකුණුම් බදු අයකරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,987,138 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,294,873 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,481,100 | 3,054,857 | - | 446,800 | 3,162,733 | - |
| කුලී | 1,362,900 | 1,483,880 | 220,150 | 1,557,000 | 1,772,281 | 23,250 |
| බලපත්‍ර ගාස්තු | 567,600 | 959,735 | - | 420,300 | 726,906 | - |
| වෙනත් ආදායම් | 49,147,500 | 46,029,379 | 2,852,925 | 50,637,770 | 41,449,160 | 8,525,189 |
| එකතුව | 53,559,100 | 51,527,851 | 3,073,075 | 53,061,870 | 47,111,080 | 8,548,439 |

### 2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩකාමර හිඟ කුලී රු.20,950 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අයකර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | හිඟ බදුකුලී රු.158,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩකාමර බදු මුළුමනින්ම අයකර ගැනීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය ප්‍රකාරව, සභාව විසින් මහජන සෞඛ්‍යය, මහජන උපයෝගී සේවාවන් සහ ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය ආදි කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව, උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ආ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරකම් 04 ක් වෙනුවෙන් ගිවිසුම්වලට එළැඹ තිබූ නමුත්, අදාළ ක්‍රියාකාරකම් ආරම්භ කර නොතිබුණි. | සති දෙකකින් කාර්යයන් සම්පූර්ණ කරනු ලැබේ. | අදාල ක්‍රියාකාරකම් අවසන් කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ රු.80,280 ක් වැයකර තිබුණත් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | වියදම් අඩුකර ගැනීමටත් ආදායම් වැඩි කර ගැනීමටත් කටයුතු කර ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා සකස් කර නොතිබූ බැවින් වැදගත් කාර්යයක් ඉටු නොකර පැවතුණි. | වාර්තා සකස් කිරීමට කටයුතු කර ඇත. | වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුවම ඉටුකර තිබුණි. | ප්‍රමාදයකින් තොරව සේවාවන් ඉටුකිරීමට උත්සාහයන් ගනිමින් පවති. | නියමිත කාලයේදී සේවාවන් සැලසීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාව විසින් විධිමත් අයුරින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, මානව සම්පත් 15 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණු බව විගණනයේදි නිරීක්ෂණය විය. | නියමිත කාලයේ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තමන් විසින්ම තනතුර හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.35,295 ක්වූ හිඟ ආපදා ණය අයකර ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පාරිතෝෂිතය ලැබූ විට මුළුමනින්ම අයකිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ණය මුදල් නියමිත කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උප කාර්යාල 05 කට අදාල දේපල 6,183 කින් වරිපනම් බදු අයකිරීම සිදු කර නොතිබුණි. | ප්‍රදේශ සලකුණු කිරීමට කටයුතු කර ඇත. | වරිපනම් බදු නියමිත කාලයේ අයකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 14 ක අයිතිය මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කරමින් පවති. | වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා විවිධ උපකරණ මිලදී ගෙන තිබුණත්, ඒවා වර්ෂ දෙකකට අධික කාලයක සිට භාවිතා කර නොතිබුණි. | ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | යන්ත්‍රෝපකරණ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ට්‍රැක්ටර්, බවුසර් සහ ට්‍රැක්ටර් ට්‍රේලර් හානියට පත්වූ තත්ත්වයේ අංක තහඩු සවි නොකර පැවතුණි. | ට්‍රැක්ටර් ට්‍රේලර් දෙකක් අළුත්වැඩියා කිරීමට ගරාජයට යොමුකර ඇත. භාණ්ඩ ඉවත්කිරීමේ කමිටුවේ නිර්දේශ සඳහා ඉල්ලීම් කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) සංචාරක සංවර්ධනය වෙනුවෙන් ලබාදුන් බෝට්ටු, යන්ත්‍ර, පාරු සහ සම්බන්ධිත උපකාරණ භාවිතා නොකර හා නඩත්තුවකින් තොරව පැවතුණි. | සංචාරක ක්ෂේත්‍රයේ කාර්යයන් සම්පූර්ණ කර භාරදීමේදි උක්ත සඳහන් කළ යන්ත්‍රෝපරණ භාවිතයට යොදවනු ලැබේ. | භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී උපකාර්යාල 04ක් විසින් පොත් 49ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හානි/පාඩු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්ම භාණ්ඩ හා සේවා ක්‍රියාකාරකම් සඳහා සකස් කර නොතිබුණි. | මූලධන කාර්යයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | සැලැස්ම් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වියදම්වල ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර විචලනයක් පැවති අතර මෙය වියදම් ඇස්තමේන්තුවේ අඩුපාඩුවක් ලෙස සැලකුණි. | පරිපූරක අයවැයක් සකස් කර වියදම් සිදු කර තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |